


කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අන්තර්ජාල පුවත් පත වෙළුම 03 - කලාපය 09 2016 සැප්තැම්බර් පිටු 05 යි

**ඇතුල් පිටු :**

ස්ථිර බෝග සායන මෙහෙයවීම හා ඇගයීම් පිළිබඳ වැඩමුළුවක් මහනුවරදී----------------------------------02

රටකජු කරල් වෙන් කරගැනීමට නව යන්ත්‍රයක් අත්හදා බැලේ-----02

කෘෂිකර්ම දෙපාර්තමේනතුවේ 18 වන වාර්ෂික සම්මේලනය------03

එළවළු වගාවේ ඒකාබද්ධ පළිබෝධ පාලනය පිළිබඳව පුහුණු වැඩසටහන් තවදුරටත්----04

හම්බන්තොටින් නව ශාක වෛද්‍යවරුන්----------------------------04

වෙල් මීයන් පාලනය සඳහා පුහුණු වැඩසටහන් අබණ්ඩව-----04

කහල්ල මිරිස් බීජ නිෂ්පාදන ගම්මානයේ ක්ෂේත්‍ර දිනයක්--------05

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**
තැ. පෙ. 01,
පරණ ගලහ පාර, පේරාදෙණිය.
දුරකථන අංක : 081 2388331/2/4
වෙබ් අඩවිය : www.doa.gov.lk

ඔබගේ අදහස් හා යෝජනා අපවෙත එවන්න
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (සන්නිවේදන),
තැ.පෙ. 24,
කෘෂිකර්ම ප්‍රකාශන ඒකකය,
ගන්නෝරුව.
දුරකථන අංකය : 081 205 8282

agripress.doa@gmail.com
Agriculture Publication Unit

# කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ජාත්‍යන්තර සම්මානයක්




ශ්‍රී ලංකාව ඇතුළු ආසියාතික රටවල් 13 ක ක්‍රියාත්මක වන ආසියානු ආහාර හා කෘෂිකර්ම සහයෝගිතා වැඩසටහනේ 2015 වසරේ විශිෂ්ටතම පර්යේෂකයාට හිමි රිදී සම්මානය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතික කිරීමේ සේවයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ආචාර්ය ලක්මිණී ප්‍රියන්තා මහත්මිය විසින් පසුගියදා හිමි කර ගන්නා ලදි. මෙම සම්මාන උළෙල පසු ගිය සැප්තැම්බර් 21 වන දින කාම්බෝජයේ සියැම් රීප් නගරයේදී පවත්වන ලදි. මෙහිදී ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ආසියානු කලාපීය සංක්‍රමික වසංගත රෝග හා පලිබෝධ පළිබඳ තොරතුරු අන්තර් හුවමාරුව සම්බන්ධීකරණය යන තේමාව යටතේ දියත් කල ව්‍යාපෘතියෙහි ප්‍රධාන පර්යේෂකයා ලෙස ආචාර්ය ලක්මිණී ප්‍රියන්තා මහත්මිය කටයුතු කර ඇත. ආසියානු ආහාර හා කෘෂිකර්ම සහයෝගිතා වැඩසටහන 2014 වසරේ සිට ක්‍රියාත්මක වේ.

මෙම ව්‍යාපෘතිය මඟින් මූලික වශයෙන් ලංකාවට සංක්‍රමණය වන කෘමීන්ගේ ගහනය හා එමඟින් වී වගාවට හා එළවළු වගාවට හානි කරන වෛරස් රෝග හඳුනා ගැනීම සිදු කර ඇත. මෙම අධ්‍යයන කටයුතු වී වගාව හා එළවළු භෝග වගාව ආශ්‍රිතව වඩාත් පුළුල්

2 පිටුවට...

1 පිටුවෙන්...

ලෙස අධ්‍යයනය කිරීමෙන් අනතුරුව මේ සඳහා ජෛව විද්‍යාත්මක ඉංජිනේරු සංකල්පයක් ලෙස, එම සංචාරක කෘමි ගහනය ස්වාභාවිකව පාලනය කරන දේශීය ස්වභාවික සතුරන් හඳුනා ගැනීම හා එම ගහනය වැඩි කර ගැනීම සඳහා ක්ෂේත්‍රය සකස් කර ගන්නා ආකාරය පිළිබඳවත් නව පර්යේෂණ කටයුතු සිදු කර ගෙන යන අතරතුර, මෙම සොයා ගැනීම් ගොවි ක්ෂේත්‍ර තුළ මේ වන විට අත්හදා බලමින් පවතී. මෙම පර්යේෂණ කටයුතු සඳහා බතලගොඩ වී පර්යේෂණ ආයතනයේ සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ) රුවන්ති මන්දනායක හා බෝඹුවල වී පර්යේෂණ ආයතනයේ සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ) බී.ඩී.එස්.ඩබ්. චන්ද්‍රසේන යන නිලධාරීන් දායක වී ඇත.

## ස්ථිර බෝග සායන මෙහෙයවීම හා ඇගයීම් පිළිබඳ වැඩමුලුවක් මහනුවරදී



පැළෑටි සංරක්ෂණ සේවය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ස්ථිර බෝග සායන වැඩසටහන් මෙහෙයවීම හා ඇගයීම් පිළිබඳ වැඩමුළුවක් 2016 අගෝස්තු 31 සහ සැප්තැම්බර් 1 යන දෙදින තුළදී මහනුවර ටොපෑස් හෝටලයේදී පවත්වන ලදී. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පැළෑටි සංරක්ෂණ සේවය හා අන්තර් ජාතික කැබී ආයතනය යන ද්විත්ව ආයතන මේ සඳහා මූලිකත්වය ගෙන කටයුතු කර ඇත. මේ සඳහා දිවයිනේ විවිධ ප්‍රදේශ වලින් පලාත් කෘෂිකර්ම අධ්‍යක්‍ෂ වරුන්, නියෝජ්‍ය අධ්‍යක්‍ෂවරුන්, පැළෑටි සංරක්ෂණ සේවයේ නියෝජ්‍ය අධ්‍යක්‍ෂ එස්. එස්. වැලිමගේ මහතා, අන්තර් ජාතික කැබී ආයතනයේ මෙරට ජාතික සම්බන්ධීකාරක පී. ටී. බණ්ඩාර මහතා ඇතුළු නිලධාරින් 50 ක් පමණ සහභාගි වී ඇත.

---

නිර්මලා හපුකොටුව - සංවර්ධන නිලධාරි

## රට කජු කරල් වෙන් කරගැනීමට නව යන්ත්‍රයක් අත්හදා බැලේ



රට කජු පඳුරෙන් කරල් වෙන් කර ගැනීමට නවතම යන්ත්‍රයක් මහඉලුප්පල්ලම ගොවිපල් යන්ත්‍ර පර්යේෂණ මධ්‍යස්ථානය විසින් නිපදවා ඇත. මෙම යන්ත්‍රය ගොවි ෂෙත්‍ර වල අත්හදා බැලීමේ වැඩසටහනක් පසු ගිය සැප්තැම්බර් මස 01 දින බකමූණ පොල් අතු වාඩිය ප්‍රදේශයේදී පවත්වන ලදී. රෝද හතරේ ට්‍රැක්ටරයට සම්බන්ධකර ක්‍රියාකරන මෙම යන්ත්‍රයෙන් පහසුවෙන් රටකජු පඳුරෙන් කරල් වෙන්කර ගත හැකි බව මෙම අත්හදා බැලීමේදී පෙනී යන ලදී. එම අත්හදා බැලීම් වලදී හඳුනාගත් දෝෂයන් හා වෙනස් කිරීම් වලින් පසුව ඉදිරියේදී රටකජු වගා කරන ගොවියන් වෙත හඳුන්වාදීමට හැකි බව එම ආයතන ආරංචිමාර්ග සඳහන් කරයි. වර්තමානයේ රටකජු ගොවීන් මුහුණු දෙන ප්‍රබල ප්‍රශ්නයක් ලෙස රටකජු පඳුරෙන් කරල් වෙන් කරගැනීමට විශාල ශ්‍රමයක් වැයවීම දැක්විය හැකිය. මෙම ගැටළුවට විසඳුමක් ලෙස මෙම යන්ත්‍රය විශාල පිටුවහලක් වනු ඇතැයි බලාපොරොත්තු වේ.

---

රංජිත් අභයලාල් - කෘෂිකර්ම උපදේශක




කෘෂි FM
කෘෂිකර්මාන්තය සඳහාම වෙන්වූ ගුවන් විදුලි නාලිකාවක පෙර ගමන්කරු. . . .
www.krushifm.lk වෙබ් රේඩියෝව

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ

# 18 වන වාර්ෂික සම්මේලනය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 18 වැනි වාර්ෂික සම්මේලනය (ASDA) පසුගිය සැප්තැම්බර් මස 8, 9 යන දින වලදී ගන්නෝරුව පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයේදී පවත්වන ලදී. මෙහි ආරම්භක සැසිය කෘෂිකර්ම අමාත්‍ය ගරු දුමින්ද දිසානායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ විය. ආරම්භක සැසිය ඇමතූ කෘෂිකර්ම අමාත්‍යවරයා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ රට පුරා විසිරී ඇති පර්යේෂණ ස්ථාන වල පර්යේෂණ නිලධාරීන් අපේ රටේ කෘෂිකර්මාන්තයට සුවිශාල මෙහෙයක් ඉටුකරන බව සඳහන් කළ අතර, ඉදිරියටත් එම පර්යේෂණ කටයුතු සාර්ථකව හා අපේ රටේ ගොවි ජනතාවට ගැලපෙන ලෙස ඉටුකරන ලෙස ඉල්ලා සිටියේය.


ඩබ්. එල්. ජී. සමරසිංහ මහතා සම්මානය ලබාගනිමින්

මෙවර සමුළුවේ ආරාධිත දේශණය සිදුකරන ලද්දේ ඩෙන්මාර්ක් හි කොපෙන්හැජන් විශ්ව විද්‍යාලයේ විද්‍යා පීඨයේ ආචාර්ය බෲස් කැම්බෙල් මහතා විසිනි. කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය රොහාන් විජේකෝන් මහතා සමුළුව අමතමින් ප්‍රකාශ කළේ, මුං ඇට වලින් අපේ රට ස්වයංපෝෂිත වීමේ කාලය වැඩි ඈතක නොවන බවත් මැද කන්නයේ සිදුකරන මුං වගාව ඒ සඳහා සුවිශාල දායකත්වයක් සපයනු ලබන බවත්ය.


අයි. යූ. මෙන්ඩිස් මහතා සම්මානය ලබාගනිමින්

පසුගිය කාලය පුරාවටම මෙරට කෘෂි පර්යේෂකයන් විසින් සිදු කරන ලද පර්යේෂණ ඇසුරින් සකස් කළ පර්යේෂණ පත්‍රිකා රාශියක් මෙවර සමුළුවේදී එලිදක්වන ලදි. වසරේ හොඳම කෘෂි විද්‍යාඥයාට හිමි රන් සම්මානය පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ ආචාර්ය ඩබ්. එල්. ජී. සමරසිංහ මහතා විසින් දිනාගත් අතර හොඳම කෘෂිවේදියා ලෙස බස්නාහිර පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ අයි. යූ. මෙන්ඩිස් මහතා රන් සම්මානයෙන් පිදුම් ලැබූහ. මෙවර හොඳම තරුණ කෘෂි විද්‍යාඥයාට හිමි සම්මානය මහඉලුප්පල්ලම ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ පර්යේෂණ නිලධාරී එච්. එම්. එස්. එන්. හේරත් මෙනවිය විසින් ලබා ගත් අතර හොඳම තරුණ කෘෂිවේදියා සම්මානය අනුරාධපුර ගොවිපල් යාන්ත්‍රිකරණ අභ්‍යාස මධ්‍යස්ථානය නියෝජ්‍ය අධ්‍යක්ෂ එන්. ඒ. ආර්. ජේ. පෙරේරා මහතා විසින් ද හොඳම පර්යේෂන පත්‍රිකාවට හිමි සම්මානය බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ඩී. එන්. සිරිසේන මහතා විසින් ද ලබා ගන්නා ලදි.


එච්. එම්. එස්. එන්. හේරත් මෙනවිය සම්මානය ලබාගනිමින්

ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ආචාර්ය බී. වී. ආර්. පුන්‍යවර්ධන මහතා මෙවර සමුළුවේ සභාපතිත්වය උසුලන ලද අතර කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් බී. විජයරත්න මහතා, කෘෂිකර්ම අමාත්‍යාංශයේ අතිරේක ලේකම් සුභ හින්කෙන්ද මහතා, කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය රොහාන් විජේකෝන් මහතා ඇතුළු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිළධාරීන් රැසක් ද මෙම සමුළුව සඳහා සහභාගි වූහ.


එන්. ඒ. ආර්. ජේ. පෙරේරා මහතා සම්මානය ලබාගනිමින්

## එළවළු වගාවේ ඒකාබද්ධ පලිබෝධ පාලනය

### පිළිබඳව පුහුණු වැඩසටහන් තවදුරටත්



වර්තමානයේ බෝග වගාවන් සඳහා කෘෂි රසායන ද්‍රව්‍ය ගොවීන් විසින් අනිසි ලෙස යොදනු ලබන අතර මේ හේතුවෙන් සාමාජය විශාල සෞඛ්‍යමය හා පාරිසරික ගැටළු රාශියකට මුහුණ දී ඇත. මේ තත්වය නිසා බෝග වගාවන් සඳහා බලපාන පලිබෝධ පාලනය සඳහා ඒකාබද්ධ ක්‍රමවේදයන් හඳුන්වා දීම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලැබේ. එම ඒකාබද්ධ පලිබෝධ පාලන ක්‍රමවේදයන් ගොවීන් වෙත ගෙන යාම සඳහා ඒ පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීම හා පුහුණු කිරීම අඛණ්ඩව පවත්වාගෙන යනු ලබයි. මේ යටතේ එළවළු වගාවේ ඒකාබද්ධ පලිබෝධ පාලනය පිළිබඳ පුහුණු වැඩසටහනක් 2016 සැප්තැම්බර් මස 22 හා 26 යන දිනයන්හි කෑගල්ල රජවක කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයේදී හා ගන්නොරුව සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේදී පවත්වන ලදී. මේ වැඩසටහන සඳහා කෘසිකර්ම නිලධාරින් 47 දෙනෙකු හා මහවැලි අධිකාරියේ කෘෂි නිලධාරින් 56 දෙනෙකු සහභාගි වී ඇත. පැළෑටි සංරක්ෂණ සේවයේ නියෝජ්‍ය අධ්‍යක්‍ෂ එස්.එස්. වැලිගමගේ මහතාගේ මූලිකත්වයෙන් මෙම පුහුණු වැඩසටහන සිදුකර ඇත.

---

නිර්මලා හපුකොටුව - සංවර්ධන නිලධාරි

## හම්බන්තොටින් නව ශාක වෛද්‍යවරුන්



කෘෂිකර්ම දෙපර්තමේන්තුවේ පැළෑටි සංරක්ෂණ සේවයේ හා අන්තර් ජාතික (CABI) ආයතනයේ මූලිකත්වයෙන් සිදුකරන කෘෂිකර්ම උපදේශකවරුන් ශාක වෛද්‍යවරුන් ලෙස පුහුණු කිරීමේ වැඩසටහන යටතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ කෘෂිකර්ම උපදේශකවරුන් 45 දෙනෙකු පුහුණු කිරීම සඳහා පුහුණු වැඩසටහන් 2016 සැප්තැම්බර් මස  26, 27, 28 දින වලදී පවත්වන ලදී. මෙම පුහුණු වැඩසටහන තෙලිජ්ජවිල දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයේදී පවත්වා ඇත. මෙහිදී මොඩියුල 01 යටතේ කෘෂිකර්ම උපදේශකවරුන් 15 දෙනෙකු ද මොඩියුල 02 යටතේ කෘෂිකර්ම උපදේශකවරුන් 30 දෙනෙකු ද පුහුණුව නිම කරන ලදී. ගොවි ක්ෂේත්‍ර වලදී බෝග වගා වලට බලපාන රෝග තත්ත්වයන් සඳහා උපදෙස් ලබා දී ඒවා සඳහා ප්‍රතිකාර නියම කිරීම මෙම ශාක වෛද්‍යවරුන්ගේ ප්‍රධාන කර්තව්‍යය වේ. මෙය සිදුකරන්නේ තෝරාගත් ප්‍රදේශවල තෝරාගත් දිනයක ගොවිමහතුන් දැනුවත් කර බෝග සායන පැවැත්වීම තුලිනි. මෙම වැඩසටහන ගොවිමහතුන් සඳහා ඉතාමත් හොඳ වැඩසටහනක් බව ගොවිමහතුන් අදහස් ප්‍රකාශ කරයි.

---

නිර්මලා හපුකොටුව - සංවර්ධන නිලධාරි

## වෙල් මීයන් පාලනය

### සඳහා පුහුණු වැඩසටහන් අඛණ්ඩව

පැළෑටි සංරක්ෂණ සේවයේ මූලිකත්වයෙන් වෙල් මීයන් පාලනය පිළිබඳ පුහුණු වැඩසටහනක් 2016 සැප්තැම්බර් මස 22 වන දින කුණ්ඩසාලේ සහකාර කෘෂිකර්ම අධ්‍යක්‍ෂ කාර්යාලීය ශ්‍රවණාගාරයේදී පවත්වා ඇත. වර්තමානයේ ප්‍රබල සෞඛ්‍ය ගැටළුවක් ලෙස හිස ඔසවනු ලබන මී උණ ප්‍රධාන ලෙස වෙල් මීයන් නිසා මිනිසුන් අතර ව්‍යාප්ත වේ. එම ගැටළුවෙන් ගොවි ජනතාව ඇතුළු සමස්ථ ජනතාව මුදවා ගැනීම සඳහා හා වෙල් මීයන් මගින් වී වගාවට සිදුවන හානි වලක්වා ගැනීම සඳහා විශේෂ දේශණ සහිතව ප්‍රායෝගික පුහුණු වැඩසටහනක් ලෙස මෙය පවත්වා ඇත. 2016 ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන යටතේ මෙම පුහුණු වැඩසටහන පවත්වා ඇති අතර මහනුවර දිස්ත්‍රික්කය තුළ සේවයේ නියුතු කෘෂිකර්ම උපදේශකවරුන් 55 දෙනෙකු මෙම පුහුණු වැඩසටහනට සහභාගි විය.

---

නිර්මලා හපුකොටුව - සංවර්ධන නිලධාරි

## කහල්ල මිරිස් බීජ නිෂ්පාදන ගම්මානයේ

# ක්ෂේත්‍ර දිනයක්





කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ හා රෝපණ ද්‍රව්‍ය මධ්‍යස්ථානයේ පැල්වෙහෙර නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්‍ෂ බීජ කාර්යාලය අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන කහල්ල මිරිස් බීජ නිෂ්පාදන ගම්මානයේ සංවිධානය කරන ලද ක්ෂේත්‍ර දිනයක් 2016 සැප්තැම්බර් මස 12 වැනි දින කෘෂිකර්ම රාජ්‍ය ආමාත්‍ය රංජිත් අළුවිහාරේ මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදි. මෙම මිරිස් ගම්මානය 2009 වසරේදී ආරම්භ කර ඇති අතර 2013 වසරේදී තව දුරටත් සංවර්ධනය කර නිෂ්පාදනය වැඩිකර ඇත. පසුව 2015 වසරේදී USDA/ SOLID ව්‍යාපෘතියේ මූල්‍ය අනුග්‍රහය යටතේ තව දුරටත් වැඩි දියුණු කර එමඟින් දේශිය මිරිස් නිෂ්පාදනය ඉහළ නැංවීමට දායක කරගෙන ඇත. ඒ යටතේ අමුමිරිස් නිෂ්පාදනය, වියළි මිරිස් නිෂ්පාදනය, මිරිස් බීජ නිෂ්පාදනය හා මිරිස් කුඩු හා අගය එකතු කළ නිෂ්පාදන සිදුකර රටට මිරිස් නිෂ්පාදන සිදු කරන ගම්මානයක් ලෙස වැඩිදියුණු කර ඇත. දැනට මෙම ගම්මානයේ MICH 03 ප්‍රභේදයෙන් අක්කර 18 ක් පමණ වගාකර ඇති අතර ඉන් නිෂ්පාදනය වන බීජ ලබන නොවැම්බර් මස සිට ගොවීන් වෙත නිකුත් කිරීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වේ. පැල්වෙහෙර නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්‍ෂ බීජ කාර්යාලය, කොන්ත්‍රාත් ගොවීන්ගේ සහයෙන් රටේ මිරිස් බීජ අවශ්‍යතාවයෙන් සියයට 90ක් පමණ නිෂ්පාදනය සිදුකරන අතර එම නිෂ්පාදනයට කහල්ල මිරිස් නිෂ්පාදන ගම්මානය වැඩි දායකත්වයක් ලබා දෙනු ලබයි. මෙම අවස්ථාව සඳහා කෘෂිකර්ම අධ්‍යක්‍ෂ ජනරාල් ආචාර්ය රොහාන් විජේකෝන් මහතා ඇතුළු විශාල පිරිසක් සහභාගී වන ලදී.

වරුණ ශාන්ත කාරියවසම් - කෘෂිකර්ම උපදේශක







කෘෂි FM

කෘෂිකර්මාන්තය සඳහාම වෙන්වූ ගුවන් විදුලි නාලිකාවක පෙර ගමන්කරු. . . .
www.krushifm.lk වෙබ් රේඩියෝව